YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION

We provide a very professional, personalised and affordable service to all your Migration related needs...

WE OFFER VERY SPECIAL RATES FOR PROVISIONAL VISA HOLDERS & STUDENTS

We enrol international students to leading Australian educational institutions as well. Our services are entirely FREE for our prospective students.

DMS
DESTINY MIGRATION SOLUTIONS
YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION

AMILA WEERASINGHE
LL.B. Grad Cert Mig Law MMIA
Registered Migration Agent
MARN 1067683

DESTINY MIGRATION SOLUTIONS
21 McMaster Court Pakenham Victoria
T / F 03 5941 4042
Call 04 3009 0385
info@destinymigrations.com
www.destinymigrations.com

MIA
Member of Migration Institute of Australia

Sri Lankan Office
Destiny Migration Solutions PVT Ltd
28 Jayanthi Mawatha Pamunuwa Road Maharagama
T / F 2841387 M 071 6161888

MATHEMATICS TUTORING

Maths Methods(CAS) 3&4

Specialist Mathematics

Maths Methods(CAS) 1&2

General Maths Advance

Mathematics Year 7-10

by Madira Ginnige
Experienced Current Secondary School Mathematics Teacher

Attending my small group tuition class will
- Increase confidence, Grades, motivation and self-esteem.
- Gain the ability to manage study time efficiently.
- Ability to manage time efficiently during exam periods.
- Provide opportunity to work through highly relevant, current Trial Sac & Examination questions.

To book/register, contact
03-98071577 or SMS 0432972667
or send an e-mail to:
madiraginige1@yahoo.com

*Individual lessons available on request

Venue: 1/17 Mummery Street, Mount Waverley 3149

කෙනෙක් දියුණු වී ඉහලට යනවා බලා
සිටින්නට බැරි නං
කර වටටම දපියවු තොප්පියක් ගහපල්ලා බං
පෙස්සං

ප්‍රේමකීර්ති ද අල්විස් ලියා, ප්‍රෙඩී සිල්වා ගායනා කළ ඒ උපහාසාත්මක ගීතයෙන් "පෙත්සම්" පිළිබඳව මැවෙන්නේ දැඩි ඍණාත්මක චිත්‍රයක් වුවද, පෙත්සමක් ඉදිරිපත් කිරීම යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කෙරෙන්නේ තමාට හෝ වෙන අයෙකුට හෝ පොදුවේ සමාජයට හෝ සිදුවන ආසාධාරණයක් ගැන වගකිව යුත්තන්ට කැඩෙතැයි යන බියෙන් සියළු විද්‍යා පරීක්ෂණ අත්හිටුවන විද්‍යාගාර යනාදී කරුණු පිළිබඳව මම මීට පෙර ලියා ඇත්තෙමි.

දහවන ශ්‍රේණිය පසු කර, උසස් පෙළ අරඹා ගණිතය විෂයය ධාරාවෙන් ඉගෙනුම ලබමින් වසරක් පසු කරමින් සිටි මට මුහුණ පෑමට සිදුවුණු තවත් එක් ප්‍රශ්ණයක් නම් මුළු විෂයය නිර්දේශයම විභාගයට පෙර කෙලෙසක පාසලෙන් ඉගෙන ගන්නද යන්නයි.

සාමාන්‍ය පෙළ විභාගය අවසාන වූ පසු ජනවාරි මාසයේ ඇරඹෙන පූර්ණ කාලීන ටියුෂන් පන්තිවලට බැඳී උදෑසන අටේ සිට සවස පහ දක්වා ඉගෙන ගනිමින් සමස්ත උසස් පෙළ විෂයය නිර්දේශයම මාස

# පෙස්සංකාරයා

ලිඛිතව පැමිණිලි කිරීමේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලියයි. යම් පුද්ගලයෙකු කෙරෙහි ද්වේශ සහගතව කෙරෙන මේ ආකාරයේ පැමිණිල්ලක දී නම්, පෙත්සම ඉදිරිපත් කරන්නා නිර්ණාමිකව සිටීම අපට බලාපොරොත්තු විය හැක. ඒ හයකින් "කවර්" කරන්නට පහසුකම් ඇති තත්කාලීන පරිසරය තුල හුදු විහිළුවක් ලෙස හැඟෙන්නට ඉඩ තිබුණද, ආනන්දයට ඇතුලත් වීමෙන් මා බලාපො-රොත්තු වූයේ උසස් පෙළ සඳහා අවශ්‍ය සියළුම දැනුම, ටියුෂන් පන්ති වලින් නොව, පාසලෙන් ම ලබා ගැනීමටයි.



සමගම, විශේෂයෙන් ම බලගතු පුද්ගලයෙකු පිළිබඳව පහල මට්ටමේ අයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සමක දී, එහි ප්‍රතිඵලය පෙත්සම්කරුවාට කොයි ලෙසකින් බලපානු ඇතිදැයි යම් සැකයක් ඇති නිසා, මෙලෙස නිර්ණාමිකව සිටීම නුවණට හුරුවේ.
"පමා නොවී එම් අකුරට" ලිපි මාලාවේ අද ඔබ කියවන මේ විසි එක්වන කොටසින් මා සැර-සෙන්නේ, මීට වසර තිස් දෙකකට පෙර දිනයක මා නිර්ණාමික පෙත්සම්කරුවෙක් වූ අයුරු සටහන් කරන්නටයි.

එදා මේ පෙත්සම ගැන මගේ පන්තියේ සිටි සිසුන් විශාල පිරිසක් ඉදිරියේ විෂයය භාර ගුරුවරයා විසින් ප්‍රකාශ කෙරුණද, ඒ සිදුවීම මා හැර පන්තියේ අන් කිසිවෙකු ගේ හෝ මතකයේ මේ දක්වා රැඳී තිබෙනු ඇතැයි සිතිය නොහැක. ඒ සමගම, ඒ පෙත්සම්කාරයා මා යැයි අද මේ ලිපිය ලියවෙන මොහොත දක්වාම දැන සිටින්නේ මා පමණක් ම බවද කිව යුතුය. මගේ පියා විසින්, ගලහිටියාව මධ්‍ය"මහා විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි මා දහවන ශ්‍රේණියේ සිට කොළඹ ආනන්දයට ඇතුලත් කරණු ලැබුවේ වඩා හොඳ අධ්‍යාපනයක් ලබා දීමේ බලාපොරොත්තුවෙන් බව අමුතුවෙන් කිව යුතු නැත. එසේ වුවද, මා ඉදිරියේ වැටී තිබුනේ සුව පහසු මල් ඇතුරූ මාර්ගයක් නොවේ. කොළඹ ගමන වෙනුවෙන් මට කිරීමට සිදුවූ කැප කිරීම සුළු පටු එකක් නොවීය. වෙනද උදෑසන හතට ගෙදරින් පිටත් වී සවස දෙකට පමණ නිවසට පැමිණි මට, ආනන්දයට යන්නට පටන් ගත් ද පටන් සිදුවූයේ උදෑසන පහයි හතලිහට නිවසින් පිටවී සවස තුනයි හතලිහ වන තුරුම නිවසින් පිට ගත කිරීමටයි.

ඒ දුක ඉවසුවද, මට දරාගත නොහැකි වූ කරුණක් වූයේ පාසලේ ඉගැන්වීමේ තිබුණු සමහර අඩුපාඩුය. පැයක් ඇතුලත ඈනුම් විස්සක් යවන, කොට කලිසම් අඳින ළමුන් ට සරදම් කරන ගුරුවරු මෙන්ම ඇත්තේ එක උෂ්ණත්වමානයක් පමණක් නිසා, එයද

එය කිසිසේත්ම වරදක් නොවේ!

ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන් ත්‍රිත්වය ගැන සළකා බලන කල, එක් ගුරුවරයෙකු ගේ මග පෙන්වීම යටතේ අවබෝධ කර ගැනීමට නොහැකිව තවත් අයෙකු ගේ පිහිටාධාර පැතීමට තරම් අසීරු කරුණු එහි ඇතුලත් බවක් නොපෙණුනි. එසේ වෙතත්, ගණිතය හදරන සිසුන් ට සාමාන්‍යයෙන් අසීරු විෂයයක් වන රසායන විද්‍යාව පිළිබඳ ග්‍රහණය නම් මේ වන විටත් කෙමෙන් ගිලිහෙමින් පැවතුණු හෙයින් එම විෂයය ඉගෙනුම නැවත නිසි මගට පත් කර ගැනීම සඳහා එක් වසරක ටියුෂන් පාඨමාලාවකට ඇතුලත් වීමට මම සිතුවෙමි.

අප උසස් පෙළ ඉගෙනුම අරඹා දැන් වසරකි. අප්‍රියෙල් මස යෙදෙන විභාගයට ඇත්තේ ද එවැනි ම කාලයකි. එසේ වුවද, ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් දෙකේම අප පන්තියේ හදරා තිබුනේ නිර්දේශිත පාඨමාලාවෙන් තුනෙන් එකක් පමණය.

මේ කාලයේ, එනම් වසර 1979 දී පැවති විෂයය නිර්දේශය ගැන නොදන්නා අයෙකුට වුවද වැටහෙන පරිදි විස්තරාත්මකව කියන්නේ නම්, ආලෝකය, තාපය, යාන්ත්‍ර විද්‍යාව, විද්‍යුතය යන ප්‍රධාන කොටස් සහ තවත් සුළු කොටස් කිහිපයකින් යුතු භෞතික විද්‍යාව ඉගෙනුම අරඹා වසරක් ගෙවුනද, අප තවමත් ආලෝකය පිළිබඳව ඉගෙන ගනිමින් සිටියෙමු. ගතිකය, ස්තිථිකය, ද්‍රවස්තිථිය යන ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වූ ව්‍යවහාරික ගණිතය විෂයයේ අප තවමත් හදරා තිබුනේ, ගති විද්‍යාවේ කොටස් දෙකක් වන ඝර්ෂණය සහ දෛශික පමණකි. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නාක් මෙන් ඊලඟට සිදුවූයේ අපේ ව්‍යවහාරික ගණිතය ගුරුවරයා පාසලට පැමිණීම හිටි අඩියේ ම නතර වීමයි. සති කිහිපයක් ගත වුවද, ඒ පිළිබඳව කිසිදු පැහැදිලි
කිරීමක් අපට නොලැබුණි.

පාසලේ දී කෙරෙන පාඩම් වලින් සියළු විෂයය